# දැන්වීමයි

## මහාමාර්ග අමාත්‍යාංශය

## ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP)

**(ලෝක බැංකු (IDA) ආධාර)**

**(ව්‍යාපෘති හැඳුනුම් අංකය : P132833)**

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රජය (GOSL) වෙත මාර්ග සංවර්ධන අධිකාරිය තුළ වත්කම් කළමනාකරණ ඒකකය පිහිටුවීම / උත්ශ්‍රේණිගත කිරීම සඳහා ලෝක බැංකුව වෙතින් ණය මුදලක් ලැබී ඇති අතර, ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (IDA) වෙතින් ලැබුණු ආධාර යටතේ වත්කම් කළමනාකරණ කොන්ත්‍රාත් සැලසුම් කිරීම / ක්‍රියාත්මක කිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය තුළ වත්කම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම එම වත්කම් කළමනාකරණ ඒකකයේ වගකීම වේ.

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් පදනම මත මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මට්ටම | අවශ්‍ය සුදුසුකම් |
| --- | --- | --- | --- | --- |
| 01 | **ප්‍රසම්පාදන විශේෂඥ** | 01 | PS 3 | 1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සමග**<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසරඅටක (08) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම<br>2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක්<br>**හා**<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම<br>**සමග**<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර හතක (07) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම<br>3) රජයේ දීප ව්‍යාප්ත සේවාවේ 1 වන පංතියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම<br>**සමග**<br>1 වන පන්තියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද<br>**පහත සඳහන් සුදුසුකම් අතිරේක සුදුසුකම් ලෙස සලකනු ලැබේ.**<br>● ලෝක බැංකුව (WB), ආසියානු සංවර්ධන බැංකුව (ADB) හෝ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) නීතිරීති ප්‍රකාරව ප්‍රසම්පාදනය පිළිබඳව විශේෂ පුහුණුවක් ලබා තිබීම අතිරේක වාසියක් වනු ඇත.<br>● පරිගණක සාක්ෂරතාවය (Windows, MS Office, Superlex / Juristul Databases)<br>● ඉංග්‍රීසි කථා කිරීමේ සහ කථා කිරීමේ හොඳ හැකියාවක් තිබීම සහ වාර්තා ඉදිරිපත් කිරීමේ හැකියාවක් තිබීම. |
| 02 | **භූගෝල විද්‍යා තොරතුරු පද්ධති විශ්ලේෂක (GIS Analyst)** | 01 | PS 4 | 1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) ප්‍රධාන විෂයක් සහිතව භූගෝල විද්‍යාව පිළිබඳව වසර 4 ක ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හයක (06) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.<br>2) රජයේ දීප ව්‍යාප්ත සේවාවේ III/II පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම<br>**සමග**<br>III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද<br>අදාළ ක්ෂේත්‍රය වනුයේ භූගෝල විද්‍යා තොරතුරු පද්ධති විශ්ලේෂක වේ.<br>**පහත සඳහන් සුදුසුකම් අතිරේක සුදුසුකම් ලෙස සලකනු ලැබේ.**<br>● විද්‍යාපති (MSc) (භූගෝල විද්‍යා තොරතුරු පද්ධති හෝ භූ තොරතුරු)<br>● භූගෝල විද්‍යා තොරතුරු පද්ධති විශ්ලේෂණ පිළිබඳ පළපුරුද්ද<br>● භූ දත්ත පද්ධති කළමනාකරණය |

## කොන්දේසි

**01. වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 64 ට වැඩි නොවිය යුතුය.

**02. වැටුප් පරිමාණය :**

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පදනම්ව වැටුප් ගෙවනු ලැබේ.

**03. රැකියාවේ නියුක්ත කිරීමේ නියමයන් :**

පත්වීම, මූලිකව වසරක කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වේ. කාර්ය සාධනය මත කොන්ත්‍රාත් දීර්ඝ කිරීම සලකා බැලිය හැකිය.

**04. අනෙකුත් ප්‍රතිලාභ :**

ව්‍යාපෘතිය විසින් මූලික වැටුපෙන් 12% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා හා 3% ක් සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයක් ලබාදෙන අතර, සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 8% ක් වනු ඇත.

05. සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර හා අනෙකුත් අදාළ තොරතුරු හා ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනය හා දුරකථන අංක ඇතුලත් අයදුම්පත, එය බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර, 2021.06.30 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය, "මගනැගුම මහ මැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. දැනටමත් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා අධිකාරීන් හි සේවයේ නියුතු අයදුම්කරුවන් ව්‍යාපෘතියේ තනතුර සඳහා වන අයදුම්පත්, තමන් දැනට දරන ස්ථිර තනතුරුවලින් නිදහස් කිරීමට එකඟතාවය පැහැදිලිව පළකරමින් තම ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. අයදුම්පත මහාමාර්ග අමාත්‍යාංශයේ "mohsl.gov.lk" වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය. අදාළ පිටපත් අමුණා නොමැති අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**ලේකම්,**
**මහාමාර්ග අමාත්‍යාංශය.**